www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බංග්ලාදේශ ආන්ඩුව ශිෂ්‍ය විරෝධතා මර්දනය කිරීමට ඇඳිරි නීතිය පනවයි

## Bangladesh regime imposes curfew to suppress student protests

**විමල් පෙරේරා විසිනි**
**2007 අගෝස්තු 28**

හදිසි නීතිය ද විශ්ව විද්‍යාලවල රඳවා ඇති ආරක්ෂක හමුදාවන් ද ඉවත් කරන ලෙස ඉල්ලා සිටි ශිෂ්‍ය උද්ඝෝෂන මර්දනය කිරීමේ ප්‍රයත්නයක යෙදී සිටින බංග්ලාදේශයේ හමුදා පිටුබලය ලබන ආන්ඩුව අගෝස්තු 22 දා ප්‍රධාන නගර හයක දින නියමයක් නැති ඇඳිරි නීතිය පැනවී ය. ඩකා අගනුවර හා ප්‍රධාන වරාය නගරය වූ චිතගොංන්ග් මෙන් ම රාජශාහි, කුල්නා, බරිසාල් සහ සිල්හෙට් යන නගරවල දී විරෝධතා ව්‍යාපාරවලට එරෙහි හමුදා කඩා පැනීම් සිදු විය.

උද්ඝෝෂන පුපුරා මතු වූයේ අගෝස්තු 20 දින ඩකා විශ්ව විද්‍යාලයේ පාපන්දු තරගයකට සම්බන්ධ වූ ශිෂ්‍යයන්ට සහ ගුරුවරයකුට හමුදාව විසින් පහරදීමෙන් අනතුරුව ය. පසු ගිය වසර අවසනේ සිට මෙම විශ්ව විද්‍යාලයේ හමුදා කඳවුරක් පැවතුනි. ශිෂ්‍යයන් සහ ඩකා පොලීසිය අතර ගැටුමෙන් අනතුරුව, විරෝධතා අනෙකුත් විශ්ව විද්‍යාලවලට ද පැතුරුනු අතර පදික වෙලඳුන් ද සාප්පු සේවකයින් ද නාගරික දුගීන් ද වීදි සටන්වලට ආකර්ශනය විය.

ඩකා විශ්ව විද්‍යාලයට පොලිස් භටයන් 1500ක් පමන යැවින. අනෙකුත් ස්ථානවලට උද්ඝෝෂන පැතිරීයත්ම තව තවත් හමුදා යෙදවින. විරෝධතා බිඳලීම සඳහා ආරක්ෂක හමුදා මගින් සිදු කෙරුනු බැටන් සහ කඳුලු ගෑස් ප්‍රහාරවලින් කිහිප සියයකට පමන තුවාල සිදු විය. රාජ්ශාහිහි 35 වියැති රික්ෂොකරුවෙක් මරා දැමින. සමස්ථයක් ලෙස, අන්තර්වාර ආන්ඩුවේ හදිසි නීති නොතකා ශිෂ්‍යයින් 87,000ක් උද්ඝෝෂනවලට සම්බන්ධ වූ බවට තක්සේරු කෙරේ.

ඇඳිරි නීතිය පැනවීමෙන් පසුව අගනුවර ව්‍යාපාර ඇන හිටියේ ය. මුලු රටෙහි සියලු රජයේ විශ්ව විද්‍යාල සහ විදුහල් වසා දමන ලදී. විරෝධතා ගැන මාධ්‍ය වාර්තා තහනමට ලක් වූ අතර ජංගම දුරකථන ජාලයන් ද වසා දමන ලදී. ඇඳිරි නීතිය ක්‍රියාත්මක වීම නිරීක්ෂනය කිරීමට පොලීසිය සීරුවෙන් තබන ලදී. අත් අඩංගුවට ගැනීම් සහ පහර දීම් සුලභ දර්ශනයක් විය.

"සදර්ගාත් සිට ගුලිස්තාන් දක්වා එන විට මා තුන් වතාවක් පහරකෑම්වලට ගොදුරු වුනා. මගේ හැඳුනුම්පත පෙන්වීමට වත් අවස්ථාවක් ඔවුන් මට දුන්නේ නෑ."යි ඩේලි ස්ටාර් පුවත් පතට සමොන් මෙහොමඩ් පැවසී ය. ද නිව් ඒජ් පුවත්පත චෝදනා කලේ ආරක්ෂක හමුදා මාධ්‍යවේදීන්ට හිරිහැර කල බවත් තමන්ගේ කාර්යභාරයන් කිරීම වැලැක් වූ බවත් ය.

විවිධ පුවත්පත්වලට සහ විද්‍යුත් මාධ්‍ය ආයතනවලට සම්බන්ධිත වාර්තාකරුවන් ද ඡායාරූප ශිල්පීන් ද කාර්ය මන්ඩල නිලධාරින් සහ සී.එන්.ජී (රික්ෂො) පදවන්නන් ද ඇතුලු අවම තරමින් ජනයා 25ක් වත් තුවාලවලට ගොදුරු වූහ.

පසුගිය බ්‍රහස්පතින්දා පැය තුනකටත් සිකුරාදා පැය 14ක් සඳහාත් ඇඳිරි නීතිය ලිහිල් කරන ලදී. නමුත් කඩා පැනීම් අඛන්ඩව පැවතින. අත් අඩංගුවට ගැනීම් 144ක් සිදු කල බව සෙනසුරාදා බලධාරීහු නිවේදනය කලහ. ඩකා විශ්ව විද්‍යාල ආචාර්ය සංගමයේ ලේකම් අන්වර් හුසේන්, එම විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති හරුන්ඩ් රෂීඩ් ඇතුලු මහාචාර්යවරුන් 4 දෙනෙක් ද ශිෂ්‍ය නායකයක ද රඳවා ගනු ලැබූවන්ට අයත් වෙති. තිදෙනෙකුට එරෙහි "අසහනය ඇවිස්සවීමේ" චෝදනා ගොනු කොට තිබේ.

රජය විසින් සිදු කරන මානව අයිතීන් කඩ කිරීම හෙලා දකිමින් එක්සත් ජනපදයේ පදනම් වන හියුමන් රයිට්ස් වොච් සංවිධානය සෙනසුරාදා ප්‍රකාශනයක් නිකුත් කලේ ය. "මෙම විරෝධතා ජ්වලිත වූයේ හදිසි නීතිය යටතේ සිදු කෙරෙන මර්දනය හේතුවෙන් වන අතර ආන්ඩුවේ ප්‍රබල ප්‍රතිචාරය ගින්නකට තෙල් දමන්නාක් මෙනි," යයි එහි ආසියානු උපදේශක අධ්‍යක්ෂක සොෆී රිචඩ්සන් ප්‍රකාශ කලේ ය.

ප්‍රධාන උපදේශක ෆාක්රුදින් අහමඩ් ප්‍රධානත්වය දරන, අන්තර්වාර පාලන ආන්ඩුවට මර්දන නීති ලිහිල් කිරීමේ කිසිදු අරමුනක් නැත. ජාතික

මැතිවරනය වටා ගොනුවෙමින් පැවැති දේශපාලන නොසන්සුන්තාවය මධ්‍යයේ ජනවාරි මස බලය ලබා ගැනීමෙන් අනතුරුව, මිලිටරි පිටුබලය ඇතිව, ආන්ඩුව හදිසි නීතිය පනවමින්, 2008 අවසන් වනතුරු මැතිවරනය කල් දැමූ අතර, දූෂන මර්දනය කිරීමේ මුවාවෙන් අත් අඩංගුවට ගැනීම් දියත් කලේ ය.

හියුමන් රයිට්ස් වොච් සඳහන් කල පරිදි " හදිසි නීතිය පැනවීමේ පටන්, බංග්ලාදේශ හමුදාවන් හිතුමතේ සිදු කරන අත් අඩංගුවට ගැනීම්, වධ හිංසා සහ අත්අඩංගුවේ දී සිදුවන මරන වැනි අනිසි ක්‍රියාවන් සඳහා වගකිව යුතු ය. ඇප ලබාගැනීමට සහ රඳවා ගැනීමේ නීත්‍යානුකූලභාවයට අභියෝග කිරීම ඇතුලු ඵලදායී ප්‍රතිකර්මයන් සඳහා හදිසි නීති බාධා පමුනුවයි. 2007 ජනවාරි භාරකාර ආන්ඩුව බලය ගත් දා සිට බලධරයෝ ජනයා 250,000කට අධික ප්‍රමානයක් රඳවාගෙන ඇත. අවාමි ලීගයේ නායකයන් හා හිටපු අගමැතිනියක ද වන ෂීක් හසීනා වසීඩ් ඇතුලු දේශපාලන නායකයින් කිහිප දෙනෙකු අත් අඩංගුවේ පසුවෙති. තවත් හිටපු අගමැතිනියක වන බෙගම් කලීඩාසියා තථ්‍ය නිවාස අඩස්සියට පත් කරනු ලැබ සිටී."

මෙම විරෝධතා "අන්තර්වාර ආන්ඩුවේ ප්‍රතිරූපයට කැලැල් ඇති කිරීමට ප්‍රයත්න දරන්නවුන්ගේ සැඟවුනු අවශ්‍යතාවල කුමන්ත්‍රනයක්" බවට හමුදා ප්‍රධානී ජෙනරල් මොයීන් යූ අහමඩ් ප්‍රසිද්ධියේ චෝදනා කලේ ය. උද්ඝෝෂනවල පරිමාවෙන් ආන්ඩුව පැහැදිලිව ම තැති ගත්තේ ය. ඩකා විශ්ව විද්‍යාලයෙන් හමුදා ඉවත් කර ගෙන ඇති අතර විරෝධය කුලු ගැන් වූ සිද්ධිය පරීක්ෂා කරන බවට පොරොන්දු වී තිබේ.

ප්‍රධාන විරුද්ධ පක්ෂ වන අවාමි ලීගය සහ බංග්ලාදේශ ජාතික පක්ෂය (බී.එන්.පී) හමුදා ක්‍රියාවන් හෙලා දැකි නමුත් සන්සුන් වන ලෙස ආයාචනා කලේ ය. අවාමි ලීගයේ වැඩ බලන සභාපති සිල්ලුර් රහමන් ප්‍රකශ කලේඃ "සාකච්ඡා මගින් බොහෝ බැරෑරුම් ගැටලු විසඳා ගත හැකි," බවයි. සිද්ධීන් "ඉතාමත් කනගාටුදායකයි" යනුවෙන් විස්තර කල, බී.එන්.පී ප්‍රධාන ලේකම් අබ්දුල් මන්නන් බ්‍රියන් ආන්ඩුවට බල කලේ "ශාස්ත්‍රීය වාතාවරනයක් යලි ඇති කිරීම සඳහා අර්බුදය විසඳීමට සාමූහික ක්‍රම මගින් ක්ෂනික පියවර ගත යුතු" බවට ය.

ආන්ඩුව මෙන් ම විරුද්ධ පක්ෂ ද උද්ඝෝෂනවල විභවීය අතුරු ප්‍රතිඵල ගැන සංවේදී ය. ශිෂ්‍ය විරෝධතා මගින් අවුලුවාලන ලද පුලුල් පරිමාන විරෝධතා හේතුවෙන් පෙර පැවති සියාඋර් රහමන්ගේ සහ මොහොමඩ් එර්ශාඩ්ගේ මිලිටරි ඒකාධිපතිත්වයන් බිඳ වැටින. ඩකා විශ්ව විද්‍යාලය වනාහි ශිෂ්‍යයින් 30,000 ද ගුරුවරුන් 1,300 ද සමන්විත රටෙහි විශාලතම විශ්ව විද්‍යාලය වන අතර රැඩිකල් ක්‍රියාකාරකම්වල මධ්‍යස්ථානයක් ලෙස සුප්‍රකට ය.

අන්තර්වාර ආන්ඩුවට එරෙහි විරෝධය පවතින්නේ සිසුන් අතර පමනක් නො වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව මගින් බල කෙරෙන ප්‍රතිව්‍යුහකරන වැඩ පිලිවෙල, බඩු මිල ඉහල යාම හා දොට්ටදැමීම් නොසන්සුන්තාව අවුලුවා ඇත. පසුගිය නොවැම්බර් මස සිට මූලික ආහාර ද්‍රව්‍යවල මිල සියයට 40කට වැඩි ප්‍රමානයකින් ඉහල ගොස් ඇත. කිරි පිටි මිල සියයට 120කින් ඉහල ගොස් ඇත. ලෝක බැංකුව අනතුරු ඇඟවූයේ දීප ව්‍යාප්ත ගං වතුරවල බලපෑම යටතේ ඉදිරි මාසවල උද්ධමනය පිම්මේ ඉහල යා හැකි බවයි. ඒ සඳහා මංමුලා සහගත ලෙස දඩ මීමකු සොයමින් සිටින මුදල් උපදේශක මිර්සා අසිසුල් ඉස්ලාම් මැතක දී චෝදනා කලේ සුලුතර ධනවත් ව්‍යාපාරිකයින් ලාභ ලබන බව ය.

රැකියා නැතිවීම් ද විරෝධතා අවුලුවාලීමට හේතු සාධක වී ඇත. අගෝස්තු 18 දා ඩකා අපනයන ප්‍රවර්ධන කලාපයේ ඇගලුම් කම්හලක් කම්කරුවන් 2,602 නෙරපූ අතර කම්කරු නොසන්සුන්තාව වැලැක්වීම සඳහා ආරක්ෂාව තර කරන ලදී. ජෙසෝර්හි රාජ්‍ය සතු කාර්පටින් ජූට් මිල්ස් හමුදා ආරක්ෂාව යටතේ කම්කරුවන් 368 නෙරපා හැරීය. එක් කම්හලක නිලධරයකු පැහැදිලි කලේ ශ්‍රම බලකායෙන් සියයට 50කින් කම්හල ක්‍රියාත්මක කිරීමේ තීරනය ආන්ඩුවේ " ප්‍රතිසංස්කරන" වැඩපිලිවෙලට අනුකූල බව ය.

අන්තර්වාර පාලන ආන්ඩුව විදේශ ප්‍රාග්ධනයේ ඉල්ලීමට සරිලන පරිදි තව තවත් පුද්ගලීකරනය, සේවක කප්පාදුව සහ රාජ්‍ය සතු ආයතන වසා දැමීම වෙනුවෙන් කැප වී සිටියි. පෞද්ගලීකරන කොමිසම ආයතන 25 පමන විකුනා දැමීම සඳහා ලැයිස්තු ගත කර ඇත.

වාර්ෂික ගං වතුර දිස්ත්‍රික්ක 39කට බලපාමින් පිටිසර ප්‍රදේශවල දැවැන්ත විනාශයක් සිදු කර ඇති අතර එමගින් භව භෝග වගාවන්ට සිදුව තිබෙන හානිය ටකා බිලියන 20ක් (ඇ. ඩො. මිලියන 290) පමන යැයි තක්සේරු කෙරේ. ආරක්ෂක හමුදා විසින් විසිරුවා හරිනු ලැබීමට පෙර අගෝසතු 20 දා ඇති තරම් පොහොර ලබා දෙන ලෙස ඉල්ලමින් දහස් සංඛ්‍යාත ගොවියෝ පබ්නා රාජ්ෂාහි මහා මාර්ගය පැයකට වඩා අවහිර කලහ.

අන්තර්වාර පාලන ආන්ඩුවටත්, එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවලටත් සහ පටි තද කර ගැනීමේ ක්‍රියාවන් පැනවීමටත් එරෙහි මෝදු වෙමින් පවතින දේශපාලන විරෝධයක දැකීම් මාත්‍රයක් ශිෂ්‍ය විරෝධතා මගින් පෙන්නුම් කර ඇත.


© www.wsws.org